## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

## නිවාස සැළසුම් ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB)

**පුහුණු පාඨමාලා හදාරණ සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම**

**(1/4/7/00/131-2024)**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල, පැලවත්ත, නො: 33, සුනිල් මාවතේ පිහිටි නිවාස සැළසුම් ගොඩනැගිලි මධ්‍යස්ථානයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන යටතේ පාඨමාලා හදාරණු ලබන සිසුන් 20 දෙනෙකුට එක් වසරක කාලයක් සඳහා නේවාසික පහසුකම් සැපයීම සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීමට මිල ගණන් කැඳවනු ලැබේ. මේ සඳහා වැඩි විස්තර www.cida.gov.lk වෙබ් අඩවියේ සහ 011-2287661/011-2699801/0777510258 දුරකථන අංක වලින් ලබාගත හැක.

1. ලංසු පෝර්මයන් නිකුත් කිරීම.

   2024.07.25 දින සිට 2024.08.07 දින දක්වා සතියේ සාමාන්‍ය කාර්යාල දිනවල පෙ.ව.9.30 සිට ප.ව.3.30 දක්වා ආපසු නොගෙවනු ලබන රු.500.00+VAT ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවා රිසිට්පත සැපයුම් නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් නියමිත ටෙන්ඩර් පත ලබා ගත හැක. ටෙන්ඩර් පත් නිකුත් කිරීම 2024.08.07 දින මධ්‍යාහ්න 12.00ට අවසන් වනු ඇත.

2. ලංසු විවෘත කිරීම

   මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා එම කවර දෙකම එක් තනි කවරයක බහා මුද්‍රා තබා පිට කවරයේ වම් කෙලවරේ CHPB ආයතනය සඳහා නේවාසික පහසුකම් සැපයීම යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2024.08.07 දින ප.ව.2.30 පෙර ලැබෙන සේ සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, නො.123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ඉහත ලිපිනයේ සැපයීම් අංශයේ ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැක.

3. ලංසු භාර ගන්නා වේලාව අවසන් වූ වහාම ඉහත ලිපිනයේ සඳහන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සැපයුම් අංශ කාර්යාලයේදී **2024.08.07** දින ප.ව.2.30 ට පැමිණ සිටින ලංසු කරුවන් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

සභාපති.<br>
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,<br>
නො 123, විජේරාම මාවත<br>
කොළඹ 07.